# බෝම්බ පිපිරීම්

කොළඹ පමණක් නොව දිවයිනේ කිසිම ප්‍රදේශයක් අද බෝම්බ ප්‍රහාරවලින් සුරක්ෂිත නො වෙයි. මැති ඇමතිවරු ද හුදී ජනයා ද බෝම්බ ප්‍රහාරවලට ගොදුරු වී මියයති. කොටි සංවිධානය අද වියරුවෙන් ක්‍රියාකරන බව පැහැදිලි ය. ඇතැම් බෝම්බ පුපුරවනු ලබන්නේ කලකිරීමට පත් කොටි සාමාජිකයන් විසින් විය හැකි ය. ආයුධ අතට හත් ත්‍රස්තවාදී සංවිධාන තම ත්‍රස්තවාදී දේශපාලනය අවසන්වන බව පෙනෙන කල මෙලෙස හැසිරීමට විශාල ඉඩකඩක් ඇත. මේ බෝම්බ ප්‍රහාර නවතා දැමිය හැක්කේ කෙසේ ද?

මෙරට ඉතාමත් දරුණු ගණයේ ත්‍රස්තවාදී සංවිධානයක් සමූලඝාතනය කිරීමේ අවශ්‍යතාව ඉදිරියේ ඇතැම් දේශපාලන පක්ෂ හා ඊනියා ප්‍රබුද්ධයන් ක්‍රියාකර ඇත්තේ ඉතාමත් ද්‍රෝහී ආකාරයකින් බව කිවයුතු ව ඇත. විජාතික බලවේගවල කොටස් වූ මොවුහු මුළුමනින් ම මෙන් සිංහල විශේෂයෙන් ම සිංහල බෞද්ධ විරෝධී වෙති. ඔවුන්ට මුදල් ලැබෙන්නේ කාගෙන් ද යන්න දැනගැනීමට අංජනම් එළි බැලීමට හෝ අටුවා ටීකා පෙරළීමට හෝ අවශ්‍ය නො වෙයි. මේ අයගෙන් ඇතැමුන් කලක් ඊනියා විප්ලවවාදීන් ව සිට ඇත්තේ ද ඊනියා සමාජවාදී රාජ්‍යයක් (මේ කිසිදා ලෝකයේ කිසි තැනක පිහිටුවිය නො හැක්කකි. කිසිවකු හට මේ සම්බන්ධයෙන් අභියෝගයක් ඇත්නම් ඒ පිළිගැනීමට අපි සූදානමින් සිටිමු. බොරු ප්‍රබුද්ධයනට තම ව්‍යාජ වීරත්වය ප්‍රදර්ශනය කිරීමට නම් කසිකබල් මාක්ස්වාදී සම්ප්‍රදායේ සටන්පාඨ උපකාරී වෙයි. අරකට අත නොතබනු මේකට අත නොතබනු ආකාරයේ සටන්පාඨ ඊනියා ප්‍රබුද්ධයන්ගේ පුවත්පත් ලිපිවලට ද ඇතැම් විට මාතෘකා වෙයි.) පිහිටුවීමට වඩා සිංහල බෞද්ධ සමාජය කෙරෙහි වෛරයෙන් ඒ නැතිකිරීමට බව ඔවුන් අද ක්‍රියාකරන ආකාරයෙන් පෙනී යයි. ඔවුන්ගේ මනසෙහි ධනපති රාජ්‍යය ලෙස මැවී ඇත්තේ සිංහල බෞද්ධ සමාජය බව ඔවුන් අද කිසිම හිරිකිතයක් නොමැතිව බටහිර ධනවාදී යැයි කියන රටවලින් මුදල් ගෙන සිංහල විරෝධී ව්‍යාපාරයක නිරතවීමෙන් ද පෙනී යයි.

අද සමාජයේ ද්‍රෝහියා යන වචනය නොයෙකුත් ආකාරයෙන් යොදා ගැනෙයි. එහෙත් ද්‍රෝහියා යනු වත්මන් සමාජ සන්දර්භය යටතේ නම් කොටි සංවිධානයට උපකාර කරන අයකු ලෙස නිර්වචනය කිරීම සුදුසු යැයි සිතමි. උපකාර කිරීම යන්න කොටි සංවිධානය පවත්වාගෙන යෑමට කිසියම් ආකාරයකින් ආධාරයක් කිරීම හා ඒ සමූලඝාතනය කිරීමට විරුද්ධ වීම ලෙස ගතහැකි ය. එහෙත් ඇතැමුන් කියනු ඇත්තේ කොටි සංවිධානය නැතිකළ හැක්කේ දෙමළ ජනයාට ඇතැයි කියන ඊනියා ප්‍රශ්න විසඳීමෙන් පමණක් බව ය. පළමුවෙන් ම ඒ ඊනියා ප්‍රශ්න කවරේද පිළිබඳ කිසිම නිර්වචනයක් මෙතෙක් කෙරී නැත. දෙමළ භාෂාවෙන් ඇතැම් පෝරමයක් නැතිවීම හෝ ඇතැම් අවස්ථාවක දෙමළ කඩ කැඩීම හෝ මෙරට දෙමළ ජනයාට දෙමළ වීම නිසා පමණක් ඇති වී තිබෙන ප්‍රශ්න නො වෙයි. දෙවනුව එලෙස ප්‍රශ්න ඇතැයි ගත්ත ද ඒ ප්‍රශ්න විසඳීම වෙනුවෙන් සිංහල විරෝධී ත්‍රස්තවාදයක් අනුගමනයකිරීම අනිවාර්ය නොවන බව වෙනත් දෙමළ පක්ෂ වර්තමානයෙහි ක්‍රියාකරන ආකාරයෙන් පැහැදිලි වෙයි.

කොටි සංවිධානය බෝම්බ පුපුරවා ජනතාව ඝාතනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට වරද පැටවීමේ නින්දිත උත්සාහයක එක්සත් ජාතික පක්ෂය නිරත වෙයි. වත්මන් එක්සත් ජාතික පක්ෂ නායකත්වය තරම් බටහිරයන් දීන ලෙස අනුගමනය කරන්නා වූ ද, සිංහල බෞද්ධ විරෝධී වූ ද නායකත්වයක් ඒ පක්ෂයෙහි ඉතිහාසයෙහි පැවතී නැත. එ ජා ප කවදත් බටහිර ගැති විය. එහෙත් මෙවැනි ගැතිකමක්, බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඉදිරියේ දණ්ඩ නමස්කාරකිරීමක් පසුගිය හැටවසරක පමණ කාලයක දක්නට නො ලැබිණි. අද එ ජා පක්ෂයේ එකම කාර්යභාරය වී ඇත්තේ සිංහල බෞද්ධකමට විරුද්ධවීම ය. ඒ සඳහා බටහිරයන්ගේ උපදෙස් පක්ෂ නායකත්වයට නොඅඩුව ලැබෙන බව පෙනෙයි. එහෙත් මේ උපදෙස් අවසාන වශයෙන් ගත්කල එ ජා පක්ෂයට ම විපත්තිකර බව තේරුම් ගැනීමට තරම් මෙරට ජනවිඥානය ගැන අවබෝධයක් පක්ෂ නායකත්වයට නැත.

එ ජා පක්ෂය කියනු ඇත්තේ කොටි බෝම්බ ප්‍රහාර නතරකිරීමට නම් තවත් ද්‍රෝහී ගිවිසුමක් බටහිරයන්ගේ මැදිහත්වීමෙන් කොටි සංවිධානය සමග අත්සන්කළ යුතු බව ය. ඒ අතර ඔවුහු මහේශ්වරන් මන්ත්‍රීවරයාගේ ඝාතනය සම්බන්ධයෙන් ආණ්ඩුවට වරද පැරවීමට උත්සාහ කරති. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු උද්ඝෝෂණවල වර්ජනවල නිරත වෙති. එහෙත් ද මු දිසානායක ඇමතිවරයා සම්බන්ධයෙන් ප්‍රකාශයක් පමණක් කර නිහඬ වෙති. මහේශ්වරන්

© Prof. Nalin De Silva

මන්ත්‍රීවරයා ඝාතනය කරනු ලැබුයේ කොටි සංවිධානය විසින් නොවේයැයි නිශ්චිතව පැවසීමට එ ජා පක්‍ෂයට ඇති සාධක කවරේ ද? එලෙස සාක්‍ෂි නොවේ නම් එ ජා පක්‍ෂය මේ කරන්නේ එක් අතකින් ආණ්ඩුවට මඩ ගැහීමකි. අනෙක් අතට ඔවුන් කරන්නේ කොටි සංවිධානය ආරක්‍ෂා කිරීමකි.

මේ ඝාතනය කරනු ලැබුයේ කවුරුන් විසින් දැයි කීමට නිශ්චිත සාධක අපට නැත. එහෙත් ඉතිහාසයේ මින් පෙර කොටි සංවිධානය නොකළ බවට එහි ආධාරකරුවන් හා බටහිරයන්ගේ කුලී කාසිවලට බැළ මෙහෙවරකරන ජනමාධ්‍යවේදීන් ලෙස පෙනී සිටින ඇතැම් ජඩමාධ්‍යවේදීන් උඩ පැන පැන කෑගැසූ අවස්ථා කිහිපයකදී ම පසුව හෙළිදරවු වුයේ ඒ ඝාතන කොටි සංවිධානයේ වැඩ බව ය. ඒ සඳහා ප්‍රසිද්ධ උදාහරණ දෙකක් නම් ටැමිල් නෙට් වෙබ් අඩවියේ සංස්කාරක ලෙස කටයුතු කළ තාරකී හෙවත් සිවරාම් හා මඩකලපු දිස්ත්‍රික් මන්ත්‍රී පරරාජසේකරම් ඝාතන ය. කොටි තමන් සමග සම්බන්ධකම් පවත්වා පසුව තමන්ගෙන් සුළුවෙන් හෝ මතවාදීව වෙනස්වන අයට කිසිම සමාවක් නො දෙති. ජඩමාධ්‍යවේදීන් තම වෘත්තීය සගයා වූ තාරකී ගැන දැන් උද්ඝෝෂණ නොපවත්වන්නේ ඇයි?

කෙසේ වෙතත් එ ජා පක්‍ෂයට බෝම්බ ප්‍රහාර නැවැත්වීමට හොඳ මන්තරයක් ඇත. ඒ බටහිර ජප කරනු ලැබුවකි. එ ජා පක්‍ෂය කියනු ඇත්තේ බටහිරයන්ගේ අනුග්‍රහයෙන් තවත් ද්‍රෝහී ගිවිසුමක් කොටි සංවිධානය සමග ඇතිකර ගත යුතු බව ය. ඊනියා සටන් විරාම ගිවිසුම ඔස්සේ සිදු වී ඇති දෑ සම්බන්ධයෙන් අපි තවමත් වන්දී හෙවමු. මාර්ග බාධක නැතිකර පරීක්‍ෂාවකින් තොරව කොටින්ට කිසිදු කරදරයක් නැතිව කොළඹට හා වෙනත් පළාත්වලට බෝම්බ ගෙනයෑමට උපකාරි වුයේ ද්‍රෝහි සටන් විරාම ගිවිසුම ය. කොටි ලැගුම් ගත් කුටි හා වෙනත් ස්ථාන පරීක්‍ෂාකිරීමට ආරක්‍ෂක අංශවලට නොහැකි වුයේ ඒ ගිවිසුම හා වෙනත් කරුණු ඔස්සේ ය.

ලංකාවේ තරම් රටට ද්‍රෝහී වන පිරිස් වෙනත් රටක ඇතැයි සිතිය නො හැකි ය. එයට ප්‍රධාන ම හේතුව මෙතරම් අනුකාරක අධ්‍යාපනයක් වෙනත් රටක නොතිබීම විය හැකි ය. අද අපට සිතන්නට පුරුදු කර ඇත්තේ බටහිර සංකල්ප ඔස්සේ ය. ඊනියා මානව අයිතිවාසිකම්වලට මුවා වී සිංහල විරෝධීව වැඩකරන්නෝ විවිධ ක්‍ෂෙත්‍රවල සිටිති. ජනමාධ්‍ය නිදහස අද වල්බුරු නිදහසක් ලෙස රටට ද්‍රෝහීව යොදා ගැනෙයි. රටේ ස්වෛරීභාවයට එරෙහිව ආයුධ ගත්තවුන්ට ඊනියා මානව අයිතිවාසිකම් වේ ද? අද මෙරට හදිසි අවස්ථා තත්වයක් පැන වී ඇත. බ්‍රිතානියේ හා ඇමරිකාවේ හදිසි අවස්ථාවල දී ඒ රටවල ඊනියා මානව අයිතිවාසිකම්, ජනමාධ්‍ය නිදහස සාමාන්‍ය අවස්ථාවල ඇති ආකාරයට ක්‍රියාත්මක වෙයි ද? එ ජා පක්‍ෂයට ජඩමාධ්‍යවේදීන්ට හා විවිධ ක්‍ෂෙත්‍රවල ඊනියා ප්‍රබුද්ධයනට අනුව ඒ කිසිවක වෙනසක් සිදුවිය යුතු නො වෙයි.

එහෙත් ඇමරිකාව ලෝකයේ තැන තැන යුද්ධ කරන අවස්ථාවල ප්‍රවෘත්ති නිර්මාණය කෙරෙන්නේ පෙන්ටගනයෙනි. ඒවා බොහෝ කලකට පසු හෙළිදරවු වෙයි. එහෙත් අවශ්‍ය අවස්ථාවේ දී ප්‍රවෘත්ති මෙහෙයවීම ආණ්ඩුව හා හමුදාව විසින් කෙරෙයි. බ්ලෙයාර් හෝ වෙනත් අයකු හෝ ඉරාක යුද්ධය සම්බන්ධයෙන් බ්‍රිතානි ජනතාවට බොරු කී බව එදා නොකියා දැන් හෙළිදරවුකිරීම දෙබිඩි පිලිවෙතකි. එමගින් එදා බ්‍රිතානි ආණ්ඩුවට රිසිසේ තම කටයුතු කරගෙන යෑමට බ්‍රිතානි ජනමාධ්‍ය ඉඩ දී අද ඊනියා ජනමාධ්‍ය නිදහසක් ඇතැයි පම්පෝරි ගැසීමට ඉඩකඩ ලබාගනී. අපට ලැබෙන කසිකබල් අධ්‍යාපනය ඔස්සේ අපි සන්දර්භයෙන් ඉවත් වී ඊනියා වාස්තවික මාධ්‍ය නිදහසක්, මානව අයිතියක් ගැන කතාකිරීමට පුරුදු වී සිටිමු.

කොටි බෝම්බ ප්‍රහාර නැතිකර හැක්කේ තවත් ද්‍රෝහී ගිවිසුමක් ඔස්සේ කොටින්ට නැවතත් නැගෙනහිර පළාත හා උතුරු පළාතේ විවිධ ප්‍රදේශ භාර දීමෙන් නො වෙයි. ඒ අතීසාරයට අමුඩ ගැසීමක්වත් නො වෙයි. අමුඩය රෙදි වැලට දැමීමකි. කොටි බෝම්බ ප්‍රහාරවලට ආණ්ඩුව වැරදිකරුවා නො වේ. ආණ්ඩුවේ ප්‍රහාර හමුවේ වියරු වැටී සිටින කොටි තම අවසන් පයයත්නයෙහි යෙදී සිටින්නේ කුමාර් රූපසිංහ වැන්නන් සිංහල බෞද්ධකමට විරුද්ධව තවත් ප්‍රයත්නයක් ආරම්භකර ඇති අවස්ථාවක ය. මේ සියළු ප්‍රයත්න පරාජය කළ හැකි බව ආණ්ඩුව, ආරක්‍ෂක අමාත්‍යාංශය හා හමුදා පෙන්නුම් කර ඇත. කොටි බෝම්බ ප්‍රහාර නැතිකළ හැක්කේ එකම එක ක්‍රියාමාර්ගයකින් පමණකි. ඒ කොටි සංවිධානය සුන්නත් දූලි කිරීමෙනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva